# මකුලාන රජමහා විහාරයේ පුරාවිද්‍යාත්මක ලක්ෂණ සහිත අංග පිළිබඳ ව අධ්‍යයනයක්

*එම්.එම්.එන්.එස්. විජේරත්න*[1]

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලිගන්හත්පත්තුවේ ගන්දහයේ කෝරළේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරම්පොළ නම් ගමෙහි මකුලාන රජමහා විහාරය පිහිටා ඇත. කණක නම් බමුණා විසින් මෙම ගල් පර්වතයට රැගෙන ආ කේශධාතූන් වහන්සේ තැම්පත් කරමින් සෑදූ චෛත්‍ය මකුලාන ලෙසින් හැඳින්වේ. මෙම ස්ථානයෙහි පුරාවිද්‍යාත්මක ලක්ෂණ සහිත අංග ගණනාවක් හඳුනාගත හැකි අතර ඒ පිළිබඳ ව මෙමඟින් අධ්‍යයනය කළ හැකි ය. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර ගවේෂණයක් මෙන් ම ද්විතීයක මූලාශ්‍රයන් භාවිත කරමින් ද තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදි. මහනුවර යුගයට අයත් යැයි විශ්වාස කෙරෙන පැරණි විහාර මන්දිරයක් පවතින අතර එලෙස හඳුන්වන්නේ විහාර මන්දිරයේ වහලයේ ඇති හැඩය, විහාර මන්දිරයේ ඇති බුද්ධ ප්‍රතිමා නෙලා ඇති ආකාරය හා සිතුවම් ආදිය නුවර යුගයට සමාන වීම නිසා ය. මෙම චෛත්‍ය ඉදි කළ කාලවකවානුව සනාථ කිරීම සඳහා සෙල්ලිපි හතක් කොටා ඇත. එහෙත් දැනට ඉතිරි ව ඇත්තේ සෙල්ලිපි දෙකක් පමණි. එඩ්වඩ් මියුලර් විසින් රචිත ග්‍රන්ථයේ මෙම සෙල්ලිපි පිළිබඳ ව සඳහන් වේ. මීට අමතර ව පියගැටපෙළ අසල ඇති පොකුණෙහි, පියගැට පෙළෙහි හා පහන්වැට ආශ්‍රිත ව නෂ්ටාවශේෂ දැකගත හැකි වේ. මෙම ස්ථානයේ පවතින අනෙක් පුරාවිද්‍යාත්මක අංගය වන්නේ නොසිඳෙන දිය පොකුණයි. මෙය ගල් පර්වතය මුදුනේ තිබෙන පොකුණක් වුව ද මෙයට ජලය සැපයීමක් නොමැත. මෙය ස්වභාවික පොකුණකි. කොතරම් නියගයක දී වුව ද මෙම පොකුණ නොසිඳී පවතින අතර මෙය හඳුන්වනේ නොසිඳෙන පොකුණ නමිනි. බෝධීන් වහන්සේට නුදුරින්, පොකුණ අසලින්, උමගක් වැනි යමක් පිහිටා ඇත. එයට ඉහළින් ඇති කළු ගලින් හා ගඩොලින් සෑදූ තාප්පයක් වැනි බැම්මක් දැකගත හැකි අතර පැරැන්නන් පවසන්නේ මෙය උමං මාර්ගයක් බවත්, එයින් රිදී විහාරයට යා හැකි බවත් ය. එහෙත් ඒ සඳහා ප්‍රමාණවත් සාක්ෂ්‍ය නොමැති බැවින් මෙය බෙනයක් ලෙස ද උපකල්පනය කළ හැකි ය. මෙම ස්ථානයෙහි අලංකාර ලෙස ගලින් නිමවන ලද සිරිපතුලක් ද දැකගත හැකි වේ. මකුලාන රජමහා විහාරයෙහි එවැනි වටිනා පුරාවිද්‍යාත්මක අංගයන් හඳුනාගත හැකි වුව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් මෙම ස්ථානය වෙත අවධානය යොමු කර තිබෙන්නේ අල්ප වසයෙනි. වර්තමානය වන විට මෙම ස්ථානය අභාවයට පත් වන ආකාරයක් දැක ගත හැකි බැවින් මේ පිළිබඳ ව තව දුරටත් අවධානය යොමු කරන්නේ නම් අගනේ ය.

***ප්‍රමුඛ පදඃ*** කුරුණෑගල, මකුලාන රජමහා විහාරය, නොසිඳෙන පොකුණ, පුරාවිද්‍යාත්මක අංග

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. Nadee123a@gmail.com